# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/21 – 2017 ජනවාරි මස 30 වැනි සඳුදා – 2017.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැළසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන-මොරටුව අපජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති අදියර II යටතේ අංක 06 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැළසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 ජනවාරි මස 17 වැනි දින,<br>
අංක 35, ලක්දිය මැඳුර,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල,<br>
නගර සැළසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1261

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 552ඒ, ලුනාව ග්‍රාම නිලධාරි වසමේ, ලුනාව ගමේ පිහිටි, සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:–

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලූෂන් ද සිල්වා මාවත |
| *නැගෙනහිරට* | : | අංක 85/6 දරන නිවාස ඉඩම |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *බටහිරට* | : | පුරන් අප්පු රජ මාවත. |

ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය: සොයාගත නොහැක.

02 - 594

1A – 25025 –17(2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*